සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

## වර්ෂ අවසාන ඇගයීම
## ஆண்டிறுதி மதிப்பீடு - 2020
## Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: ක්‍රිස්තු ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 02 |

◆ **පළමු අනිවාර්ය ප්‍රශ්නයටත් 02 - 07 දක්වා ප්‍රශ්නවලින් කැමති ප්‍රශ්න 04කටත් පිළිතුරු සපයන්න.**

(01) (1) පහත කොටස් සඳහා දස පනතෙන් අදාළ පනතක් මගින් ලියා දක්වන්න.

මිනිසා හා දේව සබඳතාව ⟶ A

මිනිසා හා මිනිසා අතර සබඳතාව ⟶ B

(2) " ඔබ මා සෙවුවේ මන්ද?" යන පැනය ඇසූ අවස්ථාවේදී ජේසුස්වහන්සේ කරමින් සිටි කාර්යයන් 2ක් නම් කරන්න.

(3) පහත සඳහන් සංකේත මගින් ජේසුස්වහන්සේ අදහස් කළ දෑ ලියාදක්වන්න.

ගොයම ⟶ A

ගොවීහු ⟶ B

(4) පහත පාඨයේ A හා B සම්පූර්ණ කරන්න.

..............A.............. ඇති කරන්නෝ භාග්‍යවන්තයෝය.ඔවුහු ............B............ යයි කියනු ලබන්නෝය.

(5) පාවුළුතුමාගේ ජීවිත පරිවර්තනයට බලපෑවේ යැයි සිතිය හැකි වැදගත් ආදර්ශ 2ක් නම්කොට ඒ එක් එක් කොටස සඳහා නිදසුන බැගින් සපයන්න.

(6) දේව රාජ්‍යයේ ලකුණු හෙවත් ප්‍රාතිහාර්ය බෙදා දැක්විය හැකි කොටස් 2ක් නම්කොට ඒ එක් එක් කොටස සඳහා නිදසුන බැගින් ලියන්න.

(7) පහත සඳහන් සත්‍යතා එළිදැක්වීම සඳහා ජේසුස්වහන්සේ ඉදිරිපත් කළ උපමාව බැගින්

★ ඒකත්වය ★ ආගන්තුක සත්කාරය

(8) සමාජය වෙනුවෙන් ඔබට ඉටු කළ හැකි යුතුකම් 2ක් ලියන්න.

(9) ජීවමාන තැනැන්වහන්සේ මළවුන් අතර සොයන්නේ මන්ද? කවුරුන් විසින් කා හට කියන ලද්දේදැයි ලියා දක්වන්න.

(10) කිතුනු තරුණ තරුණියන් ලෙස දේව ස්වභාවය / දේව ජීවිතය ඔබේ ජීවිතයේ ඇතිකර ගැනීමට ගත හැකි පියවර 2ක් ලියන්න. (ලකුණු 2x10 = 20)

(02) ' දිවැසි වැකි මගින් ජනතා සිත්සතන් අපේක්ෂාවෙන් පිරිණි'

(1) පහත සඳහන් දිවැස් වැකි ප්‍රකාශ කළ දිවැසිවරයා නම් කරන්න. **(ලකුණු 02)**

**(a)** "එම්බා බෙත්ලෙහෙමේ එප්‍රාතා , තී ජුදාහි ගෝත්‍රවලින් ඉතා අල්ප වන්නේය.

**(b)** " බලන්න කන්‍යාවක් පිළිසිඳගෙන පුත්‍රයකු බිහි කරන්නීය.

(2) කිතු උපත පිළිබඳ ප්‍රකාශවූ දිවැස් වැකි මගින් ඉදිරිපත් කළ පිරිදි ක්‍රිස්තුවහන්සේට භාවිතා වන විශේෂ නාම 3ක් ලියා දක්වන්න. **(ලකුණු 03)**

(3) " දිවැස්වැකි මගින් මිනිසාට ලැබෙන බලාපොරොත්තුව" නමින් කිතුනු පුවත්පතකට ලිපියක් ලියන්න. **(ලකුණු 05)**

**(මුළු ලකුණු 10)**

(03) 'පීඩිතවූවන්ගේ මුදවාලීම කිතුනු වගකීමයි'

(1) වත්මන් ලොව තුළ මිනිසා පීඩනයට පත්කරන හා වහල්කම්වලට ඇද දමන හේතු දෙකක් ලියා දක්වන්න. **(ලකුණු 02)**

(2) පීඩනයට පත්වූවන්ට සහනය ගෙන දීමට ජේසුස්වහන්සේ ක්‍රියාකළ ආකාරය දැක්වීමට නිදසුන් 03 ක් ලියන්න. **(ලකුණු 03)**

(3) ඔබේ පන්තියේ/ පාසලේ පීඩනයට පත්වන සිසුවකු වෙනුවෙන් ඔබට ගත හැකි ක්‍රියාමාර්ග 5ක් ලියා දක්වන්න. **(ලකුණු 05)**

**(මුළු ලකුණු 10)**

(04) 'පාවුල්තුමාගේ සාක්ෂි දැරීමේ මෙහෙවර කිතුනුවන්ට ආදර්ශයකි'

(1) පාවුල්තුමා හා එක්ව සාක්ෂි දැරීමේ පළමු ධර්ම දූත ගමනට හා දෙවන ධර්මදූත ගමනට එක් වූ එක් අයකු බැගින් නම් කරන්න. **(ලකුණු 02)**

(2) පහත සඳහන් නගරවලදී සාක්ෂි දැරීම සඳහා පාවුල්තුමා විසින් කරන ලද ක්‍රියාවක් බැගින් නම් කරන්න.

(a) ලුස්ත්‍රාව - (b) පිලිප්පය - (c) මෝල්ටාව - **(ලකුණු 03)**

(3) පාවුල්තුමාගේ සාක්ෂිදැරීමේ මෙහෙය තුළින් කිතුනුවන්ට ලබාගත හැකි ආදර්ශ 5ක් පෙළගස්වන්න. **(ලකුණු 05)**

**(මුළු ලකුණු 10)**

(05) "'දේව රාජ්‍යය' ජේසුස් වහන්සේගේ මෙහෙය කේන්ද්‍රීක තේමාවයි"

(1) දේවරාජ්‍යයේ ප්‍රතිපත්ති එළිදැක්වීම සඳහා ජේසුස් වහන්සේ ඉදිරිපත් කළ උපමා 2ක් නම් කරන්න. **(ලකුණු 02)**

(2) ජේසුස්වහන්සේගේ වදාළ පරිදි දේවරාජ්‍යයේ පුරවැසියන් අනුගමනය කළ උපමා 2ක් නම් කරන්න. **(ලකුණු 03)**

(3) දේව රාජ්‍යයේ තීරණාත්මක මෙහොතකට මුහුණදීම සඳහා කිතුනුවන් සිය ජීවිත රටාව සකසා ගත යුතු ආකාරය කරුණු 5ක් ඇසුරෙන් දක්වන්න. **(ලකුණු 05)**

**(මුළු ලකුණු 10)**

(06) 'දිවැසිවර ඉගැන්වීම මගින් සමාජය අර්ථවත් විය'

(1) ආමෝස් දිවැසිවරයාගේ සමයේ සමාජයේ දක්නට ලැබුණු දූෂණ 2ක් නම් කරන්න.

**(ලකුණු 02)**

(2) මීකා දිවැසිවරයාගේ ඉගැන්වීම් අනුව සාමය පවතින සමාජයක් දක්නට ලැබුණු ලක්ෂණ 3ක් නම් කරන්න. **(ලකුණු 03)**

(3) යෙසායාගේ කැඳවීමෙන් කිතුනු දිවියට ලැබෙන ආදර්ශය පහදන්න. **(ලකුණු 05)**

**(මුළු ලකුණු 10)**

(07) පහත දී ඇති මාතෘකා අතුරෙන් 2ක් තෝරා කෙටි සටහන් ලියන්න.

(1) ජේසුස්වහන්සේට පැමිණි පරීක්ෂා

(2) පාවුල්තුමාගේ ජීවිත පරිවර්තනය

(3) සහජීවනය ගොඩනගමු

(4) මුල් ශ්‍රාවකයන් කැඳවීම **(ලකුණු 5x2 = 10)**